**ඒරාවූර් නගර සභාව - 2021**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---

ඒරාවූර් නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ඒරාවූර් නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ

වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සහ උපයෝගි ලේඛනයේ දක්වා තිබූ හිඟහිටි ආදායම් ශේෂයන් අතර රු. 4,684,089 ක වෙනසක් දැක්වුණි. | අවසන් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබූ මුදල සභා අනුමැතිය ලබා ගෙන ඉදිරි මූල්‍ය වර්ෂයේ නිවැරදි කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීමට ප්‍රථම නිවැරදි ශේෂ හඳුනාගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවූ අවස්ථාවන් පහත දැක්වේ.

| | නීති, රීති ,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (අ) | මුදල් රෙගුලාසි 371 | රු. 416,768 ක අත්තිකාරම් මුදල අයකර ගැනීම සඳහා වර්ෂ කීපයක සිට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | වර්ෂ කීපයක සිට නිරවුල් නොවී පවතින අත්තිකාරම් මුදල කපා හැරීමට අවශ්‍ය කටයුතු කරමින් පවති. | අත්තිකාරම් මුදල් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 571(2) | තැන්පත් කර මුදල වර්ෂ දෙකක කාලයක් ඉක්මවා ඇති රු. 14,129,347 ක තැන්පතු නියාදනය කර නොතිබුණි. | තැන්පත් මුදල ආපසු ගෙවීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කෙරෙමින් පවති. | තැන්පත් මුදල අදාල අයවෙත නැවත ගෙවීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,946,800 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 13,609,375 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීම් කාර්යසාධන පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු. 19,229,423 ක හිඟ වරිපනම් බදු ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රටේ පැවති කෝවිඩ් - 19 වසංගතය හා මහජන ආදායම් අහිමිවීම හේතුවෙන් බදු අයකර ගැනීමට අපහසු විය. | වරිපනම් බදු අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | රු. 1,014,294 ක්වූ හිඟ වරෙන්තු ගාස්තු සමාලෝචිත වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු නොකර තව දුරටත් හිඟ වශයෙන් දක්වා තිබුණි. | රටේ පැවති කෝවිඩ් - 19 වසංගතය හා මහජන ආදායම් අහිමිවීම හේතුවෙන් අයකිරීම් තාවකාලිකව අත්හිටවා ඇත. | හිඟ වරෙන්තු ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වසර 10කට අධික කාලයක සිට පැවත එන ටෙන්ඩර් කුලි, මස් කඩ බදුකුලි සහ පරණ පොල බදුකුලි එකතුව රු. 1,524,685 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ගෙවිය යුතු අයගෙන් වැඩි කොටසක් හඳුනාගැනීමට නොහැකිව ඇත. තවද, නීතියානුකූලව කටයුතු කිරීමට අවශ්‍ය ලියවිලිද ලබාගත නොහැකිව ඇත. | දීර්ඝ කාලීනව පවතින හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරන අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පාර්ලිමේන්තු රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නියමය අනුව කාර්යාල ගොඩනැගිල්ල සම්බන්ධයෙන් විස්තීර්ණ වර්තාව (Comprehensive Report) වර්ෂ 05 ක් ගතවී ඇතත්, සභාව විසින් ඉදිරිපත් කර නොතිබුණි. | අදාල වාර්තාව ලබා ගැනීම සඳහා මඩකලපුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුවරයාට ලිපි යවා ඇත. | පාර්ලිමේන්තු නිර්දේශය අනුව සභාව කටයුතු කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | වසර 10කට අධික කාලයක සිට විදුලි බල මණ්ඩලයෙන් සභාවට අයවිය යුතු රු. 786,122 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගෙන නොතිබුණි. | මෙම හිඟ මුදල් සම්බන්ධයෙන් ලියවිලි කිසිවක් සභාව සතුව නොමැත. | දීර්ඝ කාලීන හිඟ මුදල් අයකර ගැනීමට හෝ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

**3.2 ව්‍යාපෘති, ක්‍රියාකාරකම් සහ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුන්නයිකුඩා මාර්ගයේ තිබෙන ආගමික ස්ථාන දෙකකට අයත් ඉඩම් අවුරුදු 33 ක දීර්ඝ කාලීන බදු වශයෙන් රු. මිලියන 22.28 කට ලබා ගෙන රු. මිලියන 193 ක ඇස්තමේන්තු මුදලකට වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීම සඳහා 2016 ඔක්තෝබර් මාසය ගිවිසුම් අත්සන් කර තිබුණද, එම කොන්ත්‍රාත් නිම කර නොතිබීමෙන් 2016 ඔක්තෝබර් මාසයේ සිට ආදායම් කිසිවක් උපයා නොගෙන මාසිකව රු. 56,000 ක මුදලක් බිම්බදු වශයෙන් සභාව විසින් ආගමික ස්ථානවලට ගෙවමින් පවතී. | LDSP වැඩ සටහන් යටතේ මාළු වෙළඳ සැල ඉදිකිරීමේ කාර්යයන් නිමවීමෙන් පසු මහජන ප්‍රයෝජනය සඳහා ලබාදී සභාව විසින් බදු ආදායමක් උපයා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ව්‍යාපෘති අදාල කාල පරිච්ඡේදය තුල නිමකර අදාල අරමුණ සඳහා යොදවාගත යුතුය. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් නිශ්චිත සංවර්ධන ආධාර වැඩ සටහන (PSDG) 2021 යටතේ ළමා උද්‍යාන සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපාදනය කර තිබූ රු. 600,000 යෙන් රු. 243,000 ක් වැයකර ගඟේ සෝදාපාළුව වැළැක්වීම සඳහා කම්බි දැල් කූඩු සහ කලුගල් 2021 සැප්තැම්බර් 13 දිනට ප්‍රථම මිලදී ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ගලු ගල් පුරවා බැම්ම (Gabion) ඉදිකර නොතිබුණි. | අදාල අඩුපාඩු අපවිසින් හඳුනාගෙන තිබුණද, සභාවේ මූල්‍ය තත්ත්වය හේතුවෙන් නිමකිරීමට නොහැකිවූ අතර, 2023 වර්ෂයේ ප්‍රතිපාදන මගින් නිම කිරීමට කටයුතු කර ඇත. | ව්‍යාපෘති අදාල කාල පරිච්ඡේදයේදි ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |

**4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරණ තිරසාර සංවර්ධන පනත අනුව තිරසාර සංවර්ධන අරමුණ සහ ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කර නොතිබිණි. | සංවර්ධන ඉලක්ක 17 ක් ඇතුලත් අප සභාවට අයත් දර්ශක 2022 අයවැයට ඇතුලත් කර සකස්කර ඇත. තවද, තිරසාර ඉලක්ක ලඟාකර ගැනීම සඳහා සභාව විසින් වැය විස්තර 2021 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර ඇත. | තිරසාර සංවර්ධන දර්ශක හඳුනා ගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |